මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.10.29 |

**මහ බැංකුව අපනයන ආදායම් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම හා සම්බන්ධ නව රීති නිකුත් කරයි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ අපනයන ආදායම් රුපියල් වලට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රීතින් අවලංගු කරමින්, 2021 ඔක්තෝම්බර් 28 දිනැති අංක 2251/42 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි නව රීති නිකුත් කරන ලදී. නව රීති ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනකරුවන් හා සේවා අපනයනකරුවන් යන දෙපිරිසටම අදාල වේ.

නව රීති වලට අනුව, පහත සඳහන් අවසරලත් ගෙවීම් සඳහා භාවිතයෙන් අනතුරුව, අපනයන ආදායමෙන් ඉතිරි වූ ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම, ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කළ යුතු ය.

(අ) ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ආ) අනුමත කර ඇති පරිදි විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම;

(ඇ) විදේශ ව්‍යවහාර ණය මුදල් ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික;

(ඈ) එක් මසක වගකීම් ද ඇතුළත්ව භාණ්ඩ මිලදී ගැනීම හා සේවා ලබා ගැනීම;

(ඉ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජන සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් සියයට දහයක් (10%) දක්වා කරන ගෙවීම්

මෙම රීති නිකුත් කිරීමත් සමඟ අපනයනකරුවන්ට තම අපනයන ආදායමෙන්, භාණ්ඩ හා සේවා අපනයනයන්ට අදාල සියලු වියදම් පියවා ගැනීමට හැකිවේ.

මේ සම්බන්ධ වැඩිදුර විස්තර, www.dfe.lk හරහා 2021 ඔක්තෝම්බර් 28 දිනැති අංක 2251/42 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළකර ඇති 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීති වෙත යොමු වීමෙන් ලබාගත හැක.